ද මැසිනොද් විදුහල කඳාන
**De Mazenod College - Kandana**

29 . 03 . 2018

# චිත්‍ර කලාව - I

පැය 3

දෙවන වාර පරීක්ෂණය 2018

13 ශ්‍රේණිය

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය
- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිලිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න
- II කොටස
  - අනු කොටස් තුනකින් සමන්විතය
  - එක් අනු කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදිලි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) සත්දෙව් රජු බුදුන් වැඳීමට ඉන්ද්‍රසාල ගුහාවට වැඩි අවස්ථාව නිරූපිතැයි සැලකෙන චිත්‍රය හමුවන්නේ,
   i. මයියංගනයෙහි
   ii. දිඹුලාගලිනි
   iii. හිඳගලිනි
   iv. තන්තිරිමලයෙනි

02) ලෞරියා නන්දර්ගර් අසෝක ස්ථම්භය මුදුනේ,
   i. සිංහ රුවක් නංවා ඇත
   ii. ගව රුවක් නංවා ඇත
   iii. ඇත් රුවක් නංවා ඇත
   iv. අශ්ව රුවක් නංවා ඇත


03) අවුකන බුදු පිළිමයට අමරාවතී කලා සම්ප්‍රදායේ ආභාසය ලැබී ඇති බව සනාථ කිරීමට මෙයින් වඩාත්ම ගැලපෙන කියමන වන්නේ,
   i. ඇඟට ඇලුණා සේ චීවරය යොදා තිබීමයි
   ii. අඩවන් දෙනෙත් හා ලඹ සවන් යොදා තැබීමයි
   iii. වමතින් දුරු චීවරය දෙපතුල් දක්වා යොද තිබීමයි
   iv. පද්මාසනයක් මත ඍජු කයෙන් වැඩ සිටීමයි

04) මහා බලිපුරම් ( මාමල්ලපුරම් ) නගරයේ වෙරළාසන්න ගල් පර්වතයක කෙලා ඇති මානව සත්ත්ව ඉරියව් සිය ගණන් නිරූපණය වන මහා භාරතයේ පුවතක් තේමා කොට ගත් කැටයම,
   i. දුර්ගා විසින් අසුරයින් පලවා හැරීම නමින් හැඳින්වේ
   ii. ගංගා අවරෝහණය නමින් හැඳින්වේ
   iii. චන්ද්‍රගුප්තගේ ආක්‍රමනය නමින් හැඳින්වේ
   iv. රාජේන්ද්‍ර චෝලගේ විජයග්‍රහණය නමින් හැඳින්වේ


05) හිර ගෙදර අංගනය නම් වූ චිත්‍රය නිර්මාණය කළ මෙම ශිල්පියා මනුෂ්‍යත්වය දෙස සානුකම්පිතව බැලූ මානව හිතවාදියෙකි. පශ්චාත් උපස්ථිති වාදියකු වූ මොහු නමින්,
   i. පැබ්ලෝ පිකාසෝය
   ii. වින්සට් වැන්ගෝය
   iii. ජෝර්ජස් බ්‍රාක්ය
   iv. එඩ්ගා ඩෙගාය

Learning Resource Center
R
De Mazenod College
Kandana

ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්න වලට පහත දක්වෙන ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.



A



B



C



D



E

06) A අක්ෂරයේ දක්වෙනුයේ රෆායෙල් විසින් සිතුවම් කරන ලද මැඩෝනා චිත්‍රයයි. මෙම චිත්‍රය කුමන නමකින් හැඳින්වේද ? ....................................................................................

07) B අක්ෂරයෙන් දක්වෙන්නේ ශ්‍රී ලංකාවේ පැරණි රාජධානියක කලාව නිර්මාණ අතුරෙන් විචාරක ප්‍රධානයට ලත් වූ විශිෂ්ට නිර්මාණයක් වූ සිංග රුවකි. මෙය හඳුන්වන්නේ කුමන රාජධානියක නටඹුන් අතුරෙන්ද ? ....................................................................................

08) C අක්ෂරයෙන් දක්වෙන්නේ" චෞර පන්චසිකය " නම් වූ සාහිත්‍ය ග්‍රන්ථයට අනුව නිර්මාණය වූ " බිල්හාහා හා චම්පාවති " නම් වූ චිත්‍රයයි මෙය කුමන කලා සම්ප්‍රදායක් නියෝජනය කරයිද ? ....................................................................................

09) D අක්ෂරයෙන් දක්වෙන " අයිස්ක්‍රීම් වෙළෙන්දා " නම් වූ චිත්‍රය 43 කණ්ඩායමේ ශිල්පියෙකුගේ නිර්මාණයකි මෙම ශිල්පියා කව්ද ? ....................................................................................

10) E අක්ෂරයෙන් දක්වෙන චිත්‍රය නිර්මාණය කළ පෝල් ගොගෑන් විවිධ කම් කාටොලු මැද චිත්‍ර කලාව වෙනුවෙන් ජීවිත කාලයම කැප කළ ශිල්පියෙකි. එක්තරා දූපතක ජන ජීවිතය මොහුගේ නිර්මාණයක්ට වැඩි වශයෙන් පාදක වී ඇත. එම දූපත කුමක්ද ? ....................................................................................

අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ නිවැරදි නම් √ ලකුණද වැරදිනම් X ලකුණද ඉදිරියේ ඇති තති ඉර මත යොදන්න.

11) ස්වර මාධුර්‍ය හා අර්ථ රසය සංයෝජනය වූ රාගමාලා චිත්‍ර මෝගල් චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණශීලීත්වය පෙන්වන කදිම නිර්මාණයක්ස (......................)

12) චෝල ගෘහ නිර්මාණ ශිල්පි ක්‍රමයට අනුව ඉදිකරන ලද අංක 1 ශිව දේවාලය පොලොන්නරුවේ ඉදිවූ මුල්ම ශිව දේවාලයයි (......................)

13) රේඛා කර්මය හා වර්ණ පූර්ණය අනුව නිම වූ නුවර යුගයේ සිතුවම් කලාව හුදෙක් අක්ෂි ගෝචර බවින් යුතුව නිර්මාණය වූවකි (......................)

14) ගම්පල යුගයේ ඉදිවූ ගඩලාදෙණිය විහාරය දකුණු ඉන්දිය ගෘහ නිර්මාණ ශිල්පය අනුව ඉදිකරන ලද අතර එයට ශ්‍රී ලාංකික බෞද්ධ ස්වරූපයක් එක්කරලීමටද උත්සහ දරා ඇත. (......................)

15) දුර්ගා විසින් මී ගව යක්ෂයින් ( අසුරයින් ) පන්නා හැරීම නැමති කැටයම මහාබලි පුරම් හි මහිෂමාධනී ගුහාවේ බිත්තයක නෙළන ලද්දකි (......................)

29.03.2018
Grade - 13
චිත්‍ර කලාව - 1

ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

16) ප්‍රාග් ඓතිහාසික යුගයේ ගුහා චිත්‍ර අතර නග්න පිරිමි දරුවකු වටකරගෙන නටන කාන්තාවන් සමූහයකගේ රූ සටහන් දක්වෙන ස්පාඤ්ඤයේ පිහිටි ගුහාව කුමක්ද? ..............................................................

17) ජයදේවයන් විසින් රචිත ගීත ගෝවින්දයේ එන අනුරාගී සිද්ධි රාජ්පුට් ශිල්පියාගේ ජනප්‍රිය තේමා බවට පත්විය. එම ග්‍රන්ථයේ එන ප්‍රධාන චරිත දෙක නම් කරන්න. ....................................................................................
..............................................................................

18) ග්‍රීක සම්භාව්‍ය යුගයේ බිහිවූ දිව්‍ය අංගනාවන් තිදෙනා සහ ඇතිනා දෙවඟන යන මූර්ති කාගේ නිර්මාණයන්ද ? ..........................................................................................................


19) ඇතැන්ස් ගුරුකුලය, පර්නාසිස් ඇතුළු සිතුවම් සතරත් එකම ශාලාවක් තුල රෆායෙල් විසින් සිතුවම් කොට ඇත. ශාලාව නම් කරන්න. ..........................................................................................................

20) කන්ද උඩරට හාරිස්පත්තුව ප්‍රදේශයේ හමුවන මැදවල විහාරය ගෘහ නිර්මාණ ශිල්ප ක්‍රමයට අනුව කුමන විහාර ගණයට අයත්වේද ? ..........................................................................................................


ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත F,G,H,I,J නම් කර ඇති රූප සටහන් ඇසුරෙන් තෝරන්න.




F



G



H



I



J

Learning Resource Center
R
De Mazenod College
Kandana

21) 'F' රූප සටහනින් දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය වන්නේ,
   i. අනුරාධ පුරයේ ථූපාරාම වටදාගෙයයි
   ii. මිහින්තලේ අම්බස්තල වටදාගෙයයි
   iii. මැදිරිගිරියේ වටදාගෙයයි
   iv. පොළොන්නරුවේ වටදාගෙයයි

22) 'G' රූප සටහනින් දක්වෙන හින්දු ආගමික ගොඩනැගිලි සංකීර්ණය.
   i. මහබලිපුරම් හි රථදේවාල සමූහයයි
   ii. එල්ලෝරාවේ පර්වත කපා සැකසූ දේවාල සමූහයයි
   iii. පොළොන්නරුවේ දක්නට ලැබෙන හින්දු කෝවිල් සමූහයයි
   iv. කළුගල් ඉදි වූ පල්ලවයන්ගේ ගොඩනැගිලි සමූහයකි

23) 'H' රූප සටහනින් දැක්වෙන භාරතයේ හමුවන සුවිශේෂී නිර්මාණයක් වූ මෙය,
  i. අජන්තාවේ ලෙන් විහාරයක අභ්‍යන්තර දසුනකි
  ii. අජන්තාවේ ලෙනකට ඇතුළුවන දොරටුවක දසුනකි
  iii. එල්ලෝරාවේ හින්දු දෙවොලක ආලින්දයේ දසුනකි
  iv. එල්ලෝරාවේ ජෛන ගුහාවක පිවිසුම් දොරටුවකි


24) 'I' සිතුවම නිර්මාණය කළ ශිල්පියා වන්නේ,
  i. ක්ලෝඩ් මොනේ
  ii. මේරි කසාට්
  iii. වින්සන්ට් වැන්ගෝ
  iv. එඩ්ගා ඩෙගා

25) 'J' සිතුවම් නිර්මාණයෙන්
  i. සර්කස් කරුවන්ගේ සංක්‍රමනික ජීවිතයේ යතා ස්වරූපය පෙන්වයි
  ii. ආනාගතවාදී ලෝකයට වඩා වෙනස් ඇති නවීන යාන්ත්‍රිකත්වය නිරූපණය කරයි
  iii. මෙය ජෝර්ජ් බ්‍රාක්ගේ ඝණිතවාදී සිතුවමකි
  iv. පැබ්ලෝ පිකාසෝගේ ඝණිතවාදී යුගයේ සිතුවමකි


අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.



K



L



M



N



O

26) K අක්ෂරයෙන් දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය ගම්පොළ යුගයේ නිරමාණය වූවකි. මෙය නිර්මාණය කළ ශිල්පියා කව්ද ? ..............................................................................

27) L අක්ෂරයෙන් දැක්වෙනුයේ 43 කණ්ඩායමේ ශිල්පියෙකු වන L.T.P. මංජු ශ්‍රී ගේ සිතුවමකි. මෙය නම් කර ඇත්තේ කුමන නමකින්ද ? ..............................................................................


28) M අක්ෂරයෙන් දක්වෙනුයේ උපස්ථිතිවාදී ශිල්පියෙකුගේ නිර්මාණයක් වන වෝටර්ලූ පාලම නම් වූ සිතුවමයි. මෙය නිර්මාණය කළ ශිල්පියා කව්ද ? ................................................................................

29) N අක්ෂරයෙන් දක්වෙන්නේ යක්ෂණී රුව කුමන නිර්මාණයකට සම්බන්ධ වුවක්ද ?

........................................................................................................

30) O අක්ෂරයෙන් දක්වෙන මැටි බඳුන ඉතා දියුණු චිත්‍ර කලාවක ලක්ෂණ පිළිඹිමු කරයි. මෙය හමුවන්නේ කිනම් රටක කලා නිර්මාණ අතුරෙන්ද ? ................................................................................................

ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට හිස්තැන් පිරවීමට පහත දක්වෙන රූප සටහන් ඇසුර කරගන්න.



P Q R S T

31) P අක්ෂරයෙන් දක්වෙන පරණවිතාන මහතාගේ පිළිරුව තැම්පත් කර ඇත්තේ කොහේද ?

.......................................................................

32) Q අක්ෂරයෙන් දක්වෙන්නේ කාෆ්රේ පාරාවන්ගේ මූර්තියකි මෙම කුමන සම්ප්‍රදායික ලක්ෂණ පෙන්වයිද ? .......................................................................

33) R අක්ෂරයෙන් දක්වෙන්නේ කනිෂ්ක රජුගේ පිළිමයකි. මෙය කුමන ශිල්පීන් විසින් නිම වූවන්ද ?


...........................................................................

34) S අක්ෂරයෙන් දක්වේන් හෙන්රි මුවර්ගේ මූර්තියකි. මෙම නිර්මාණයේ තේමාව කුමක්ද ?

..................................................................................

35) T අක්ෂරුයෙන් දක්වෙන්නේ පොළොන්නරුවේ ගල් විහාරයේ ඇති වැඩ හිඳින විශාල බුද්ධ ප්‍රතිමාවයි. මෙහි පිළිමය පිටුපස ඇති හරස් බාල්කවල කෙළවරෙහි දක්නට ලැබෙන අල්ප උන්නත කැටයම කුමක්ද ? .....................................................................................

ප්‍රශ්න අංක 35 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් සිතුවම උපයෝගී කර ගන්න.



36) මෙහි දක්වෙන සිතුවම ........................................................................ සිතුවමකි.

37) මෙම චිත්‍රය සිතුවම් කරන ලද්දේ ............................................................. විසිනි.

38) මෙය සිතුවම් කිරීමේදී ශිල්පියාගේ අභිප්‍රාය වූයේ හිරු උදාවක ඇතිවන ආලෝකයේ ........................................................................ චිත්‍රණය කිරීමයි.

39) මෙම චිත්‍රය සැලෝනය විසින් ප්‍රතික්ෂේප කරන ලැබූ අතර එයට හේතු වූයේ, ස්වභාවික හිරු උදාවක් ප්‍රකාශ කිරීමේදී අනුගමනය කළ යුතු ............................................................ ලක්ෂණ මෙහි දක්නට නොලැබීමයි.

40) මෙම චිත්‍රය නූතන විචාරකයින්ගේ දැඩි ප්‍රසාදයට හේතු වූයේ, හිරු උදාවක ................................................ ................................ ඇතිවන ක්ෂණික වෙනස්වන ස්වභාවය නවතාවයකින් යුතුයව සිතුවම් කොට ඇති බැවිනි.

චිත්‍ර කාලව I

II කොටස

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.

අ කොටස

චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය, ශ්‍රී ලංකාව

01) ජෝර්ජ් කීට්, ආසියාවේ පිකාසෝ යන විරුදාවලියෙන් හැඳින්වේ. ආගමික මෙන්ම ලෞකික තේමා සිත්තම් කිරීමේදී ඔහු දක්වා ඇති පරිණත බව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

02) ශ්‍රී ලංකාවේ විහාර චිත්‍ර කලාවේ මහත් පෙරළියක් ඇති කරමින් නවතම චිත්‍ර කලා සම්ප්‍රදායක් මහනුවර කන්ද උඩරට රාජධානිය ඇසුරෙන් බිහිවිය.
1. කන්ද උඩරට විහාර තුළ චිත්‍ර දක්නට ලැබෙන සාම්ප්‍රදායික ලක්ෂණ හයක් ලියන්න.
2. කරගම්පිටිය විහාරයේ සිතුවම් දෙගල්දොරුව විහාරයේ සිතුවම් සමඟ සැසඳීමේදී දක්නට ලැබෙන වෙනස්කම් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

ආ කොටස

චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය, ඉන්දියාව

03) ක්‍රිස්තු වර්ෂ 1 සිට ක්‍රි.ව. 5 දක්වා බෞද්ධ කලා මාධ්‍යස්ථානයක්ව පැවති ගාන්ධාර භාරතයේ බෞද්ධ කලා ඉතිහාසයේ වැදගත් ස්ථානයක් හිමිකර ගනී,
1. ගන්ධාර ශිල්පීන් වෙතින් බිහි වූ බුදු පිළිම තුනක් නම් කරන්න.
2. විචාරකයින් අර්ථ දක්වන පිරිදි ගන්ධාර කලාවේ ස්වභාවය කෙටියෙන් පහදන්න.
3. ගන්ධාර කලා සම්ප්‍රදායට සමකාලීනව පැවති මථුරා කලා සම්ප්‍රධාය තුළ බිහිවූ බුදු පිළිම ගාන්ධාර පිළිමවලට වඩා අධ්‍යාත්මික ගුණයෙන් පරිපූර්ණය මථුරා හිටි පිළිමය ඇසුරු කොටගෙනෙ මෙය විමසන්න.

04) අජන්තාව ඉන්දියාව කලා ඉතිහාසයේ හමුවන විශිෂ්ඨතම චිත්‍ර කලාගාරය ලෙස හැඳින්විය හැකිය.
1. අජන්තාවේ 17 වන ගුහාවෙන් හමුවන චිත්‍ර 4 නම් කරන්න.
2. අජන්තා ශිල්පියාගේ රේඛාව හා වර්ණාලේප ක්‍රම ගැන කෙටි ඇගයීමක් කරන්න.

ඉ කොටස

සංස්කෘතික පසුබිම හා රසාස්වාදය, යුරෝපය

05) යුරෝපා චිත්‍ර කලාව, පුනර්ජීවන යුගය මතින් ඇරඹෙන උපසරිතවාදයෙන් පසු යුග ගණනාවක් තුළ වෙනස්කම් රැසකට භාජනය විය.
1. උපස්රීතවාදය ආරම්භවීමට හේතු වූ කරුණු කෙටියෙන් දක්වන්න.
2. උපස්රීතවාදය තුළ දක්නට ලැබූ මූලික ලක්ෂණ මේ යුගේ බිහි වූ කලා කෘති ඇසුකර ගනිමින් පහදන්න.

06) ක්‍රි.ව. 330 පමණ රෝමයේ කොන්ස්තන්තිනෝපල් නගරය ආශ්‍රිතව බිහි වූ කලා නිර්මාණ තුළ ප්‍රධාන තැනක් ගන්නේ මෝසැක් (Mosaic) සම්ප්‍රදායයි.
1. මොසැක් සම්ප්‍රදාය ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
2. තියඩෝරා රැජින හා සේවිකාවෝ නැමති චිත්‍රය ඇසුරෙන් මාධ්‍ය හැසිරවීම ප්‍රකාශනය ඇතුලත් වන පරිදි අගයීමක් කරන්න.